# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1975/74 – 2016 ජූලි 15 වැනි සිකුරාදා – 2016.07.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බැලුංගල ජල සම්පාදන ක්‍රමයේ බැලුංගල ගබඩා ජලාශය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් දෙකක් අවශ්‍ය වී ඇති හෙයින් අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් දෙකේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජූලි මස 01 වැනි දින,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය,<br>
අංක 35, 'ලක්දිය මැදුර',<br>
නව පාර්ලිමේන්තු පාර,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල.

5/2/1/1188

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 115, බැලුංගල ග්‍රාම නිලධාරී වසමේ බැලුංගල ගමේ, බැලුංගල වත්ත නමැති ඉඩම පෙන්නුම් කෙරෙන, ඒ. එම්. ඩී. අතපත්තු බලයලත් මිනින්දෝරු විසින් පිළියෙල කරන ලද අංක 681, පිඹුරේ කැබලි අංක 1 හා 2 හි සඳහන් පර්චස් 11.4ක් පමණ වන පහත මායිම් තුළ වූ ඉඩම කොටස.




*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක 01**

උතුරට : නිවාසවල සිට ප්‍රධාන මාර්ගය දක්වා පාර; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස හා බලයලත් මිනින්දෝරු සැලසුම් 1253 පිඹුරේ කැබලි අංක 1A.

**කැබලි අංක 02**

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස හා කැබලි අංක 01; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: බලයලත් මිනින්දෝරු සැලසුම් 1253හි කැබලි අංක 1A සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :

එස්. ඒ. ඒ. නසාර් මහතා,
අංක 207 ඒ,
බැලුංගල,
කඩුගන්නාව.

07 - 1208

---

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට විසල් රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමයේ ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජූලි මස 01 වැනි දින,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

5/2/1/1185

### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්නන්තොට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කන්නන්තොට ගමේ පිහිටි කන්නන්තොට ජනපදය නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු, එල්. සී. කේ. ලියනගේ මහතා විසින් පිළියෙල කරන ලද අංක: WB/R/2015/005 පිඹුරෙහි දක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මු.පි.කෑ. 639හි කැබලි අංක 15; දකුණට: මු.පි.කෑ. 639හි කැබලි අංක 77; බටහිරට: දෙලගහ හේන නැමති ඉඩම.

ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :

අබ්දුල් මජීඩ් පසීමතුල් නසිලියා,
ඒ.එම්.එම්. නිලුපර් මහතා බාරේ,
A76, ඉහලගම,
කන්නන්තොට.

07 - 1209

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.